# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාව

**නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, අධ්‍යාපන, නිවාස හා ඉදිකිරීම, රැකිරක්ෂා, පළාත් පරිපාලන, පළාත් පාලන හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

## බස්නාහිර පළාත

2007 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ
අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සටහන් කළේ 2007-02-23

# බස්නාහිර පළාත

## 2007 අංක 01 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ප්‍රඥප්තිය

බස්නාහිර පළාත සඳහා අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන්කර තැබීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, සකස් කිරීම හා අපහරණය කිරීම, කළමනාකරණය කිරීම පිණිස බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් පිහිටුවීම සඳහාද, එහි අදාල කටයුතු මෙහෙයවීම පිණිස අරමුදලක් පිහිටුවීම සඳහාද, ඉහත කී කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත ඇතැම් බලතල අනුයෝජණය කිරීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික කාරණා සඳහාද, බස්නාහිර පළාත් සභාවේ 1999 අංක 09 දරණ අ. ක. අ. ප්‍රඥප්තිය පරිච්චින්න කිරීම සඳහාද විධිවිධාන සලසනු පිණිස වූ පඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වන ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන දිනයෙන් පසු එය ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු ''නියමිත දිනය'' වශයෙන් සඳහන් කරනු ලබන) දිනයයකදී ක්‍රියාත්මක වන්නේය. — ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

## 1 වන කොටස

### බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සංස්ථාපනය කිරීම

2. (i) මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. සංස්ථාගත කිරීම

(ii) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට වෙන්කර දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. අධිකාරිය විසින් එම නමින් නඩු පැවරීමද නඩු පවරනු ලැබීමද කළ හැකිය.

3. (1) අධිකාරිය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

අධිකාරියේ සමාජිකයන්

(අ) නිල බලයෙන් පත්කරනු ලබන සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් එනම්,
   (i) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජ්‍ය ලේකම්වරයෙක්.
   (ii) බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්,
   (iii) බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා.
   (iv) බස්නාහිර පළාත් නියෝජ්‍ය ලේකම් (මුදල්)

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන
   (i) අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතරින් හතර දෙනෙක්ගෙන් හා
   (ii) මුදල් කොමිසම නියෝජනය කරනු ලබන සාමාජිකයකුගෙන් හා
   (iiii) බස්නාහිර පළාතේ සියළුම මහ නගර සභා නියෝජනය කිරීම සඳහා එක් නගරාධිපතිවරයෙක්, සියළුම නගර සභා නියෝජනය කිරීම සඳහා එක් නගර සභා සභාපතිවරයෙක් හා සියළුම ප්‍රාදේශීය සභා නියෝජනය කිරීම සඳහා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දෙදෙනෙක් වශයෙන් සංශෝධනය කල යුතුය.

(ඇ) (i) උප වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන් අපද්‍රව්‍ය කළමානාකරණ කාර්යයන්ට අදාල කවර හෝ සමාගමක කොටස් හිමි අයකු අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙකු හෝ උපදේශකයෙකු නොවිය යුතුය.

(2) ඇමතිවරයා විසින් පත් කරනු ලබන සමාජිකයන් අතුරින්, එක් අයෙක් ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව පූර්ණ කාලීන සභාපතිවරයෙක් හැටියට පත් කළ යුතුය.

(3) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධූරය හිස් කළහොත් මිස, අධිකාරියේ සෑම සාමාජිකයකුම ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධූර දැරිය යුතුය. තවද, ඔහු ධූරයෙන් ඉවත්කරනු ලැබ ඇත්නම් මිස නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ පත්කරනු ලබන සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ලිඛිත දැනුම්දීමක් මගින් ස්වකීය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ සාමාජිකයාගේ ධූරකාලයෙන් ඉකුත් නොවී ඇති කාලය ධූර දැරීමට අමාත්‍යවරයා විසින් එකී විධිවිධාන යටතට ගැනිය හැකි වෙනත් තැනැත්තෙකු පත්කරනු ලැබිය යුතුය.

(5) අධිකාරියේ රැස්වනු ලබන සෑම දිනයක් සඳහාම එක් එක් රැස්වීමකට සහභාගී වූ සෑම සාමාජිකයෙකුටම අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය.

4\. (1) අධිකාරියේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතුය. අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) අධිකාරියෙහි සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන තැබිය යුතුය.

5\. (1) අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් බලය දී ඇති සියලු කාරණ සහ ප්‍රශ්න මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලබන අධිකාරියෙහි රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය. අධිකාරියෙහි බලතල බහුතරය වෙත සතුවිය යුතු බව

(2) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ ඡන්දය, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සමලෙස බෙදී තිබෙන අවස්ථාවක, එම රැස්වීමේ මූලාසනය දරන අධිකාරියෙහි සභාපති හෝ වෙනත් සාමාජිකයෙකුට තමාට ඇති ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේය.

(3) අධිකාරියෙහි යම් රැස්වීමක් සඳහා වූ ගණපූර්ණය සාමාජියන් පස්දෙනෙකු විය යුතුය.

(4) අධිකාරියේ සමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබියදී වුවද, අධිකාරියට ක්‍රියාකළ හැකිය. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සමාජිකයෙකු පත්කිරීමෙහි හෝ නම් කිරීමෙහිලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොටගෙන අධිකාරියෙහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අලවංගු වීම හෝ අවලංගු වූ සේ සලකනු ලැබීම සිදු නොවිය යුතුය.

(5) මෙම ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂකවරයා අධිකාරියෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතුය.

(6) අධිකාරියෙහි රැස්වීම්වලට පැමිණ සිටීමේ සහ ඒ රැස්වීමවල කතාකිරීමේ හිමිකම අධිකාරියෙහි ලේකම්වරයාට තිබෙන අතර, ඒ රැස්වීම්වල ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොමැත.

## II වන කොටස

# උපදේශක සභා

6. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්ය සඳහා අවශ්‍යයැයි අමාත්‍යවරයා සළකන යම් කරුණක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීම සඳහා අධිකාරිය විසින් උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය හැකිය. උපදේශක සභා පත්කිරීම

(2) උපදේශක සභාව සඳහා අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් සාමාජිකයින් සංඛ්‍යාවක් අධිකාරිය තීරණය කරනු ලබන හා ක්‍රියාකරනු ලබන කොන්දේසි මත පත්කරනු ලැබිය හැකිය.

(3) උපදේශක සභා රැස්වීම්වල ගණපූර්ණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ද ඇතුළුව, එකී කාර්ය පරිපාටිය නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලයද උපදේශක සභාවට තිබිය යුතුය. උපදේශක සභා සෑම සාමාජිකයෙකුම විසින් ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගියහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස පත්කරන ලද දින සිට අවුරුදු 3ක් ධූරය දැරිය යුතුය.

(4) ඉල්ලා අස්වන බවට අධිකාරියෙහි සභාපති වෙත ලිපියක් යැවීමෙන් යම් සාමාජිකයෙකුට ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධූර කාලය ඉකුත් වීමෙන් හෝ ස්වකීය ධූරය හිස්කරන සාමාජිකයෙකු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතුය.

(6) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ උපදේශක සභා සාමාජිකයෙකුට ස්වකීය ධූරයෙහි කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීමට අධිකාරිය විසින් වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය.

(7) උපදේශක සභාවක යම් සාමාජිකයෙකු ඉවත් කිරීම යෝග්‍ය යැයි අධිකාරිය සලකනහොත් අධිකාරිය විසින් එකී සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකිය.

## III වන කොටස

# අධිකාරියෙහි අරමුණ

7. අධිකාරියෙහි අරමුණු පහත දැක්වෙන පරිදි වේ. අධිකාරියේ අරමුණු

(1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(2) පළාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවලින් පරිසරයට එකතු වන අපද්‍රව්‍ය උපරිම ලෙස වළක්වා පළාතේ මහජනයාගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද යහපත සඳහා පරිසරය පිරිසිදුව තබාගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම.

(3) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශ තුල ජනනය වන අපද්‍රව්‍ය පරිසරයට හා සෞඛ්‍යයට උපද්‍රවකාරී නොවන අන්දමින් බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීමේ කාර්ය විධිමත් කිරීම සඳහා සැලසුම් කිරීම, උපදෙස් දීම, සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම, පළාත් පාලන ආයතන හා ඊට අදාල අනෙකුත් ආයතන සමග එක්ව කටයුතු කිරීම හා එමගින් සිදුවිය හැකි ආපදාවන් නිශ්චය හා තක්සේරු කිරීම, ඒ සඳහා අවශ්‍ය කාර්ය පටිපාටි සකස් කිරීම සහ ඊට අදාලව ක්‍රියා කිරීම.

(4) අපද්‍රව්‍ය නැවත පාවිච්චි කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධයෙන් පර්යේෂන පැවැත්වීම

(5) අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස බැහැර කිරීම නිසා දූෂණය වී ඇති ස්ථාන, ප්‍රදේශ සහ කලාප යථා තත්වයට පත් කිරීම සඳහා සැලසුම් කිරීම, නියමයන් පැනවීම හා ඊට අදාලව ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ අධීක්ෂණය කිරීම.

(6) පළාත තුල දේශීය හෝ විදේශීය මුදල් ආධාර සහිතව ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධිකාරිය, වෙනත් ආයතනයක් හෝ පුද්ගලයකු විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ව්‍යාපෘතීන් පළාත් පාලන ආයතනයන් සහ අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

(7) අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අධිකාරිය විසින් පළාත තුල ඇති අනෙකුත් ආයතන සමඟ එක්ව හෝ වෙන් වෙන්ව අදාල ලිපි ලේඛන, වාර්තා පොත්පත්, තොරතුරු සහ දැන්වීම් ආදිය ප්‍රකාශයට පත්කිරීම හා මහජනතාව දැනුවත් කිරීම.

(8) අධිකාරියෙහි පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාව තුල හෝ විදේශයන්හි පිහිටි වෙනත් සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

(9) අපද්‍රව්‍ය ඇතිවීම අඩු කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වීම, දැනුවත් කිරීම, ඊට අදාල නියමයන් පැනවීම.

## IV වන කොටස

# අධිකාරියෙහි බලතල හා කර්තව්‍ය

8. (1) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්පත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම, — අධිකාරියේ බලතල

(2) අධිකාරියේ බලතල හා කර්තව්‍යයන් නිවැරදිව ඉෂ්ට කිරීම හා ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය ගිවිසුම්වලට එළඹීම.

(3) අධිකාරිය විසින් සපයනු ලබන සේවා සහ පහසුකම් වෙනුවෙන් ප්‍රඥප්තියේ සඳහන් වගන්තීන්ට අනුකූලව ගාස්තු අය කර ගැනීම.

(8) උපදේශක සභාවක යම් සාමාජිකයෙක් නොදන්වා තුන් වතාවක් සහ දන්වා හෝ නොදන්වා හය වතාවක් උපදේශක සභාවට නොපැමිණි විට ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

(4) අපද්‍රව්‍ය ජනනය වීම, සංයුතිය තීරණය කිරීම, වර්ග කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, සැකසීම, බැහැර කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, දත්ත එක්රැස් කිරීම හා වාර්තා ලබාගැනීම.

(5) අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, වර්ග කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, සැකසීම හා බැහැර කිරීම විධිමත් කිරීම, පාලනය කිරීම, එකී කාර්යයන් හී නිරත වන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන නොවන පුද්ගලයන්ට බලපත්‍ර දීම, ගාස්තු අයකිරීම විධිමත් කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් අනු නීති පැනවීම.

(6) විෂයභාර අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ එකඟතාවය මත පනවන රෙගුලාසිවලට යටත්ව අධිකාරිය විසින් බලපත්‍රලබාගත් ආයතන සමග ගිවිසුම් ගත වීමේ බලය පළාත් පාලන ආතයනය සතු විය යුතුය.

(7) අධිකාරිය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන සියළුම තනතුරු විධිමත් පටිපාටීන්ට අනුව ඇති කිරීම හා එවැනි යම් තනතුරකට, නිලයකට අධිකාරිය සුදුසුයැයි සලකන වැටුප්, දීමනා හෝ පාරිශ්‍රමික නිගමනය කිරීම.

(8) අධිකාරිය විසින් පත්කරනු ලබන තැනැත්තෙක් අධිකාරියෙහි තනතුරුවලට පත්කිරීම හා පාලනය කිරීම, ඉවත් කිරීම, විධිමත් කිරීමට අදාල කාර්ය පරිපාටි සකස් කිරීම.

(9) අධිකායේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියළුම දේවල සාමාන්‍ය පරිදි ඉටු කිරීම සහ අධිකාරියේ බලතල හා කර්තව්‍ය ඵලදායි ලෙස ඉටු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.

(10) දැනට පවත්නා නීතිය යටතේ පළාත් සභාවට බලය පවරා ඇති ප්‍රමාණයට අරමුදල්, තාක්ෂණය, විශේෂඥ ඥානය හෝ වෙනත් ආධාර ලබාගැනීම පිණිස විදේශ ආයතන සමග සාකච්ඡා කිරීම සහ එවැනි ඉල්ලීම් ශ්‍රී ලංකා රජය මගින් සිදුකිරීම.

(11) අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ නීති හා රෙගුලාසි උල්ලංඝනය කිරීම පිළිබඳව මහජනයා, පළාත් පාලන ආයතන හෝ වෙනත් ඕනෑම ආයතනයක් මගින් කෙරෙන පැමිණිලි පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධව සුදුසු පියවර ගැනීම.

## V වන කොටස

# අධිකාරියේ කාර්ය මණ්ඩලය

9. (1) අධිකාරිය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරයෙකු පූර්ණ කාලීනව සිටිය යුතු අතර, ඔහු අධිකාරියෙහි මඟ පෙන්වීම යටතේ සැමවිටම ක්‍රියා කළ යුතුය. — අධිකාරියේ කාර්ය මණ්ඩලය

(2) අධිකාරියෙහි කටයුතු මෙහෙයවීම, අධිකාරියේ බලතල කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීමද, අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනය, පාලනය, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා වෙත භාරවිය යුතුය.

(3) කාර්යක්ෂම ලෙස අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය සහ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යැයි අධිකාරිය සලකන නිලධාරියන් හෝ සේවකයන් මෙම ප්‍රඥප්ති විධිවිධාන අනුව පනවන ලද කාර්ය පරිපාටියන්ට අනුකූලව අධිකාරිය විසින් තනතුරෙන් හෝ නිලයෙන් ඉවත් කිරීම සිදුකළ හැකිය.

## VI වන කොටස

# මුදල්

10. (1) අධිකාරියට අධිකාරියේම නමින් අරමුදලක් විය යුතුය. — අධිකාරියේ අරමුදල

(2) (අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කල සමමත කරනු ලබන සියලුම මුදල්.

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමෙහිලා අධිකාරියට ලැබිය හැකි සියළු මුදල්.

(ඇ) පාර්ලිමේන්තුව විසින් සාදනු ලබන්නා වූ ඕනෑම නීතියකින් හෝ නීතියක් යටතේ අවසර දෙන ප්‍රමාණයට කවර හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රධාන වශයෙන් අධිකාරියට ලැබිය හැකි සියළු මුදල් සහ

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය විසින් පනවනු ලබන නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් සියලු දඩ මුදල්.

(ඉ) අධිකාරියෙහි බැරට උපචිත වන්නාවූ සියළුම මුදල් අධිකාරියෙහි අරමුදලට බරකරනු ලැබිය යුතුය.

(3) අධිකාරියට ලැබී. අධිකාරියෙහි අරමුදලට ගෙවනු ලැබිය යුතු සියළුම මුදල් ආණ්ඩුකාරතුමා අනුමත කළ රාජ්‍ය අංශයේ බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතුය.

11. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීමේදීද, අධිකාරියේ සාමාජිකයන්ට සහ අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීමේදී ද මේ ප්‍රඥප්ති යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමෙහිදී ද අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීමේ කාර්ය සඳහා සහ අධිකාරිය විසින් කලින් කල බලය දෙනු ලබන වෙනත් යම් කාර්ය සඳහා අධිකාරියේ අරමුදල් අධිකාරිය විසින් ගෙවනු ලැබිය හැකිය. — වියදම්

(2) අධිකාරියෙහි අරමුදලින් කරනු ලබන සියළු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර අධිකාරිය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ දෙදෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

12. (1) අධිකාරියෙහි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. අයවැය ලේඛන

(2) අධිකාරියෙහි සභාපතිවරයා විසින් එක් වර්ෂයකදී, රීති මගින් නියම කරනු ලැබ ඇති දිනයකදී හෝ ඊට පෙර සහ රීතිවල දක්වා ඇති ආකෘතිය අනුව, ඊළඟ වර්ෂය සඳහා ඇස්තමේනතුවක් එම වර්ෂයේදී ලබාගත හැකි ආදායම හා යෝජිත වියදම පිළිබඳ විස්තර ඇතුළත්ව පිළියෙල කොට, අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) එම ඇස්තමේන්තුව අදාල වන වර්ෂය ආරම්භවීමට පෙර අධිකාරිය විසින්ම එහි යම් සංශෝධන කිසිවක් තිබේනම්, ඒවාද සමග අවසාන වශයෙන් සැළකිල්ලට භාජනය කොට සම්මත කරනු ලැබිය යුතුය.

(4) අධිකාරියේ සභාපතිවරයා විසින් අවශ්‍ය නම් කවර හෝ අවස්ථාවකදී අතිරේක ඇස්තමේන්තුවක් පිළියෙල කොට අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(5) යම් ඇස්තමේන්තුවක් හෝ අතිරේක ඇස්තමේනතුවක අඩංගු සියළු විෂයයන් නැතහොත් ඉන් කිසිවක් සම්මත කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් යම් විෂයක් එකතු කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකිය.

13. (1) අධිකාරියෙහි ආදායම් සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳව රීති මගින් නියම කරනු ලබන නිසි ගිණුම් පොත් තබාගැනීමට සැලැස්විය යුතුය. අධිකාරියේ ගිණුම්

(2) සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ආදායම්, වියදම් ගිණුම හා ශේෂ පත්‍රය අනුගාමී වර්ෂයේ මාර්තු 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

14. (1) අධිකාරියෙහි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන අදාල විය යුතුය. ගිණුම් විගණනය

(2) අදාල ගිණුම් විගණනයේදී 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධානද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතුය.

(3) (අ) 14 (1) සඳහන් පරිදි යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ වාර්තාව ලැබීමේදී එම කරුණු වලට අදාලව පැහැදිලි කිරීම් සහිත පරිපාලනය කිරීම පිළිබඳව අධ්‍යක්‍ෂකගේ වාර්තාවක් පහත දැක්වෙන ලේඛන සමග අමාත්‍යවරයා වෙත යැවීමට අධිකාරිය විසින් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය.

(i) විගණකාධිපතිවරයාගේ වාර්තාව
(ii) ශේෂ පත්‍රය සහ
(iii) ලාභ අලාභ ගිණුම

(ආ) (අ) ඡේදය යටතේ තමා වෙත එවන ලද වාර්තාවේ සහ ලේඛනවල පිටපත්අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

## VII වන කොටස

# අපද්‍රව්‍ය කළමනාකරණය

15\. (1) අපද්‍රව්‍ය පොදු හෝ පෞද්ගලික පාරක් මත, ජලාශයකට, ඇලකට දොළකට, ජලපහරකට, ඔයකට, ගඟකට, වැවකට, කලපුවකට හෝ මුහුදට යම් පොදු ස්ථානයක් මත දැමීම හෝ පෞද්ගලික ස්ථානයක් මත දැමීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබූවිට 1 වන උපලේඛනයෙහි 2 වන තීරුවෙහි සඳහන් අපද්‍රව්‍ය ජනනය වන ප්‍රභවයෙහි ස්වභාවය අනුව, ඊට අනුරූපීව එම උපලේඛනයෙහි 3 වන තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොඅඩු 4 වන තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොවැඩි දඩයකට යටත්විය යුතුය. — වරද සහ දඩ

(2) 1 වන උප වගන්තියේ සඳහන් වරදක් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයක බලයලත් නිලධාරියෙකු විසින් අල්ලාගනු ලැබූ තැනැත්තෙකු එකී වගන්තිය යටතේ වන වරද පිළිගන්නා විටකදී ඔහු එසේ කිරීමට කැමති නම් එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ චෝදනා ඉදිරිපත් කිරීම වෙනුවට මෙහි 2 වන උපලේඛනය 2 වන තීරුවේ සඳහන් එම අපද්‍රව්‍ය ජනනය වන ප්‍රභවයේ ස්වභාවය අනුව එම උපලේඛනයේ 3 වන තීරුවේ සඳහන් දඩ මුදලක් බල ප්‍රදේශයට අදාල පළාත් පාලන ආයතනය වෙත ගෙවීම් කල හැකි අතර, එසේ මුදලක් ගෙවීම්කර රිසිට්පතක් ලඟ තබා ගත යුතුය.

එවැනි දඩ මුදල් ගෙවීමකදී අදාල පුද්ගලයා සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කිරීමක් නොකරනු ඇත.

(3) (2) උප වගන්තිය යටතේ උපචිත දඩ මුදලින් 80% ප්‍රතිශතයක් වරද සිදුකිරීමට අදාල බල ප්‍රදේශයේ පළාත් පාලනය ආයතනයන්හි පොදු අරමුදලට බැර විය යුතු අතර, ඉතිරි 20% ප්‍රතිශතයකින් යුත් ප්‍රමාණයක් අධිකාරියෙහි අරමුදලට අදාල පළාත් පාලන ආයතන විසින් මාසිකව බැර කළ යුතුය.

16\. (1) අපද්‍රව්‍ය වර්ග කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, සැකසීම හා බැහැර කිරීම පිළිබඳ ක්‍රියාකිරීම, විධිමත් කිරීම, පාලන කිරීම, පරිපාලනය කිරීමටත්, කසල හෝ පහසුවෙන් දැවෙන වෙනත් අපද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීමටත්, බස්නාහිර පළාතේ මහ නගර සභාවක් නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදීමටත්, එසේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීමටත්, වෙනස් කිරීමට හා පරිච්ඡින්න කිරීමට මහ නගර සභාවකට, නගර සභාවකට හා ප්‍රාදේශීය සභාවකට බලය තිබිය යුතුය. — අතුරු ව්‍යවස්ථා සැකසීමට පළාත් පාලන ආයතන වෙත බලය ඇති බව

(2) මෙම ප්‍රඥප්තිය යටතේ කිසිදු අතුරු ව්‍යවස්ථාවක් හෝ යම් අතුරු ව්‍යවස්ථාවක සංශෝධනය කිරීමක්, වෙනස් කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු සහ එකී අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරුනු ලබන තුරු බල නොපැත්විය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවන්ට (1) උපවගන්තිය යටතේ එය පළකිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින්, එකී අතුරු ව්‍යවස්ථාවට අවසර නොදීම නොකරන ලෙසට වූ යෝජනාවක් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළයුතු අතර, එය පළාත් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් පරිච්ඡින්න හෝ සංශෝධනය කළ හැක. පළාත් සභාව මගින් පරිච්ඡින්න කිරීමේ හෝ සංශෝධනය කිරීමේ නිවේදනයක් නොපමාව ගැසට් පත්‍රයේ පළ කල යුතුය. තවද එකී පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම. එකී පළකිරීමේ දින සිට එහෙත්, ඒ දිනයට පෙරාතුව එම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලැබ තිබිය හැකි යම් දෙයකට හෝ ආරම්භ කර තිබිය හැකි යම් නීති කෘත්‍යකට හානියක් නොමැතිව බලපෑ යුතුය.

(4) මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද සෑම අතුරු ව්‍යවස්තාවක් මගින්, එම අතුරු ව්‍යාවස්ථාව උල්ලංඝනය කිරීම, ඒ උල්ලංඝනය සංස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රු. 5000/- නොවැඩි දඩයකින් දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්විය හැක.

## VIII වන කොටස

# සාමාන්‍ය විධිවිධාන

17. (1) අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බල දෙනු ලැබූ වෙනත් යම් නිලධරයෙකු විසින් කවර හෝ වෙලාවක යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවං — සෝදිසි කිරීමේ බලය

(අ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් පරීක්‍ෂා කිරීම හා සෝදිසි කිරීම.

(ආ) එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් හෝ සාමාන්‍යයෙන් පිටකරනු ලබන, බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන පන්තියක හෝ වර්ගයක වියහැකි යම් දූෂ්‍ය කාරකයන්ගේ නියදි ලබාගැනීම.

(ඇ) ඒ උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් ක්‍රියාකාරීත්වයට හෝ පාවිච්චියට අදාල වූ හෝ එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කිරීමට, බැහැර කිරීමට හෝ තැන්පත් කිරීමට අදාල වූ තොරතුරු යම් පොත්, වාර්තා හෝ ලේඛන පරීක්‍ෂා කිරීම.

(ඈ) ඒ උපකරණයෙන් හෝ කාර්මික පිරියතේ ඡායාරූපයක් ගැනීම හෝ අවශ්‍යයයි තමා සලකන එම පරීක්‍ෂණය පවත්වාගෙන යාමේදී දක්නට ලැබෙන යම් පොත්වල, වාර්තාවල හෝ ලේඛනවල පිටපත් ගැනීම හෝ,

(ඉ) එම පරිශ්‍රය තුළ හෝ ඒ මත පවත්වා ගෙන යනු ලබන එම වෙළඳාමෙහි කර්මාන්තයෙහි හෝ කාර්යාවලියෙහි පාවිච්චි කරනු ලබන, පාවිච්චි කරනු ලැබිය හැකි හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් ඉන්ධනයක, වස්තුවක හෝ ද්‍රව්‍යයක නියදි ගැනීම කල හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ එම කාර්ය ඉටු කිරීමේදී යම් ප්‍රබල බාධක ඇතිවිය හැකි බවට අධිකාරියේ යම් බලයලත් නිලධරයකුට හෝ නිලධරයන්ට ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකුට හෝ නිලධරයන්ට හෝ සාධාරණ හේතු පෙනී යන අවස්ථාවක ඔහුට පොලිස් නිලධරයෙකු සමඟ යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු විය හැකිය.

18. (1) මේ ප්‍රඥප්තියේ අරමුණ සඳහා පළාත තුල පිහිටි යම් නිශ්චල දේපලක් අත්කර ගැනීම අවශ්‍ය බව අධිකාරිය අදහස් කරන විටදී අත්පත් කරගැනීමට අපේක්ෂිත දේපල සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ ඉල්ලීම මත කරනු ලබන අමාත්‍ය මණ්ඩල නිර්දේශයන් මගින් | නිශ්චල දේපල අත්කර ගැනීමේ බලය

(අ) එකී දේපල රජයේ දේපලක් වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ 9 වන උපලේඛණයේ ලැයිස්තුව අංක (1) හා (2) පරිශිෂ්ඨයේ 1 : 2 විෂය යටතේ වූ කාර්යයක් සඳහා එකී දේපල අධිකාරියට ලබාදෙන ලෙස

(ආ) එකී දේපල පෞද්ගලික දේපලක් වන විට ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ වූ කාර්යයක් සඳහා අධිකාරිය වෙනුවෙන් මධ්‍යම රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් අත්පත් කර දෙන ලෙස ඉල්ලීමේ යෝජනාවක් සම්මත කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන යෝජනාවක් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කර ඇති විටදී එකී යෝජනාව,

(අ) රජයේ දේපලක් සම්බන්ධයෙන් වන විට, එම දේපළ අයත් රජයේ ආයතනය වෙත හෝ,

(ආ) පෞද්ගලික දේපලක් සම්බන්ධයෙන් වන විට, මධ්‍යම රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා වෙත,

අපද්‍රව්‍ය කළමනාකරණ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒ පිළිබඳ නියමිත ආකෘති පත්‍රයේ ප්‍රධාන ලේකම් මගින් යොමු කළ යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රයක් මත, එකී දේපල අධිකාරියට පවරා ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතුය.

19. (1) මෙම ප්‍රඥප්තිය යටතේවූ කාර්ය සම්බන්ධයෙන් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් පරීක්ෂා කළ හැකි අතර, එසේ පරීක්ෂා කොට අධිකාරියට විශේෂ හෝ සාමාන්‍ය විධානයක් ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු වන්නේය. | අමාත්‍යවරයා සතු බලතල

(2) අධිකාරියේ කටයුතුවලට අදාලව තමාට අවශ්‍ය වන්නාවූ කිසියම් තොරතුරු ලිඛිතව තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකිය.

20. (1) මේ ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමට හා ගාස්තු අය කිරීමට අදාල පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල නොවන රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය. රීති සෑදීමේ බලය

(අ) අධිකාරියේ රැස්වීම් පැවැත්වීම.

(ආ) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් අධිකාරියේ අධ්‍යක්ෂකගේ බලතල හා කාර්ය.

(ඇ) ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(ඈ) ගිණුම් තැබීම.

(ඉ) අධිකාරියේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම.

(ඊ) අධිකාරියේ සේවකයින්ට හා නිලධාරින්ට ගෙවීම් කටයුතු කිරීම.

(උ) කසල ජනනය වන ස්ථානයේදීම විධිමත්ව ස්ථානගත කිරීම, නිසි ක්‍රමවේදයක් යටතේ කසල ජනනය වන ස්ථානයෙන් එකතු කිරීම, මාර්ග පිරිසිදු කිරීම, විවෘත කසල රඳවනය භාවිතයෙන් ඉවත් කිරීම. කසල ප්‍රවාහනය විධිමත් කිරීම, කසල සම්පතක් ලෙස භාවිතා කිරීම, අවසාන බැහැරලීම විධිමත් කිරීම.

(2) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමෙන් පසු මාස 03 ක් ඇතුලත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, එකී රීතියට අවසර නොදීම නොකරන ලෙසට වූ යෝජනාවක් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය පළාත් සභාව යෝජනා සම්මතයක් මගින් පරිච්ඡින්න හෝ සංශෝධනය කළ හැකිය. පළාත් සභාව මගින් පරිච්ඡින්න කිරීමේ හෝ සංශෝධනය කිරීමේ නිවේදනයක් නොපමාව ගැසට් පත්‍රයේ පළ කල යුතුය. තවද, එකී පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම එකී පළකිරීමේ දින සිට එහෙත් ඒ දිනයට පෙරාතුව එම රීතිය යටතේ කරනු ලැබ තිබිය හැකි යම් දෙයකට හෝ ආරම්භ කර තිබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නොමැතිව බලපෑ යුතුය.

21. (1) (අ) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යැයි උද්දේශික යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධවද, ප්‍රඥප්තිය යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය මත අධිකාරියේ යම් නිලධාරියෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි උද්දේශික යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් නිලධාරියෙකුට විරුද්ධවද, අධිකරණය ඉදිරියේ නඩු නොපැවරිය යුතුය.

(2) 1 වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරන ලද වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

22. (1) අධිකාරියේ යම් සාමාජිකු හෝ අධිකාරියේ යම් සේවා නියුක්තයකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයකු වශයෙන් සලකනු ලැබිය යුතුය. අධිකාරියේ සාමාජිකයන්, සේවා නියුක්තයන් රජයේ සේවකයන් බව

(2) අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතුය.

23. මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක යම් විධිවිධානයක් යටතේ හෝ යම් විධිවධානයක් ප්‍රකාර තමා වෙත සතු වූ හෝ පැවරුණු යම් කාර්යයක් කිරීමේදී හෝ යම් අධිකාරයක් ක්‍රියාවේ යෙදවීමේදී අධිකාරියේ යම් නිලධරයකුට ඕනෑකමින් බාධා පමුණුවන කවරකු හෝ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසක් නොඉක්මන දඩයකට හෝ මාස තුනකට අනාඅඩු වසර එකකට නොවැඩි සිරගත කිරීමක් හෝ එකී දෙයාකාරයකින්ම හෝ දඬුවමකට යටත් විය යුතුය. අධිකාරියේ නිලධාරීන්ට, සේවකයන්ට බාධා කිරීම සම්බන්ධයෙන් දඬුවම්

## IX වන කොටස

# අන්තර්කාලීන විධිවිධාන

24. 1 වන වගන්තියේ සඳහන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමිත දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1999 අංක 9 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය පරිච්ඡින්න කරනු ලැබේ. අන්තර්කාලීන විධිවිධාන

25. (1) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී බස්නාහිර පළාත් සභාවේ 1999 අංක 9 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කරන ලද බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සතුව තිබූ :-

(අ) සියලු චංචල හා නිශ්චල දේපල සහ

(ආ) සියලු වත්කම් සහ බැරකම්

අධිකාරියේ චංචල හා නිශ්චල දේපළ, වත්කම් හා බැරකම් වශයෙන් සැලකිය යුතුය.

(2) නියමිත දිනයට පෙරාතුව වූ දිනයේදී බස්නාහිර පළාත් සභාවේ 1999 අංක 9 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධරයන් හෝ සේවකයන් අධිකාරියේ නිලධරයන් හෝ සේවකයන් වශයෙන් සැලකිය යුතු යි.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ. — අර්ථ නිරූපනය

"අමාත්‍යාංශය" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාරඅමාත්‍යාංශය අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත් සභාව අදහස් වේ.

"අමාත්‍යංශයේ ලේකම්" යන්නෙන්, බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ලෙස පත්කරන අයෙකුද අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, බස්නාහිර පළාත තුල ඇති මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නාවූ හෝ සමාන වන්නාවූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ ආයතනයක් හෝ අධිකාරියක් ඊට ඇතුලත් වේ.

"පුද්ගලයා" යන්නට, පොදු සංස්ථාවක්, සමාගමක්, රජයට අනුබද්ධ ආයතනයක් ද මෙයින් අදහස් වේ.

"දූෂණය" යන්නෙන් පරිසරය වැඩදායි ලෙස උපයෝගි කරගැනීමට අහිතකර ලෙස හෝ මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුබසාධනයට නැතහොත් සත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ජලජ ජීවනයට හෝ සෑම වර්ගයකම ශාඛවලට උපද්‍රවකාරී හෝ උපද්‍රවකාරී තත්වයක් ඇති විය හැකි වන ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිට කිරීමෙන් හෝ බහා තැබීමෙන් පරිසරයේ යම් කොටසක භෞතික, තාපජ, රසායනික, ජෛවී හෝ විකිරණශීලී පදාර්ථයන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ.

"අපද්‍රව්‍ය" යන්නෙන්, මිනිසාගේ පැවැත්මට හා සෞඛ්‍යයට හිරිහැර, තර්ජන හා කරදර ගෙනදෙන හෝ කාලයත් සමග එසේ වීමට ඉඩ ඇති, ඉවතලන දෑ, ප්‍රමාණයෙන් විශාල වූ ඉවතලන දෑ, අළු, ගොහොරු, මඩ, ඉවතලන තෙල්, සත්ත්ව සහ මිනිස් මළපහ, ඉවතලන ආම්ලික හා භාෂ්මික දෑ සත්ව මළකුණු වැනි වැදගත් නොවන ශේෂ වූ දෑ සහ නාගරික අපද්‍රව්‍ය මෙහි ලා ගැනේ.

# උපලේඛණ 01

| වරද | ජනනය වන ස්ථානය | දඩ (රුපියල්) | |
|---|---|---|---|
| | | අවමය | උපරිමය |
| අපද්‍රව්‍ය බැහැර කිරීම සහ තැන තැන අපද්‍රව්‍ය දමා යාම | නිවාස | 500/- | 5,000/- |
| | **අන්තරාය නොවන අපද්‍රව්‍ය** | | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 5,000/- | 15,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික හා කර්මාන්තශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 10,000/- | 25,000/- |
| | **අන්තරායකාර අපද්‍රව්‍ය** | | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 10,000/- | 30,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික හා කර්මාන්තශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 25,000/- | 50,000/- |
| | **සායනික අපද්‍රව්‍ය** | | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ආරෝග්‍යශාලා ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 10,000/- | 30,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ආරෝග්‍යශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 25,000/- | 50,000/- |
| 02. අන්තරායකාරී නොවන නාගරික අපද්‍රව්‍ය අන්තරායකාරී හෝ සායනික අපද්‍රව්‍ය මිශ්‍රකර පළාත් පාලන ආයතන හෝ ඔහු විසින් පත්කරනු ලැබූ තැරැව්කරුවෙකුට භාර දීම. | 01. කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්තශාලා | 5,000/- | 10,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා | 10,000/- | 25,000/- |
| | 03. කුඩා හෝ මධ්‍යම පරිමාණයේ ආරෝග්‍යශාලා | 5,000/- | 10,000/- |
| | 04. * විශාල ප්‍රමාණයේ ආරෝග්‍යශාලා | 10,000/- | 25,000/- |

## * සළකුණ

| ව්‍යාපාරය | විස්තරය |
| --- | --- |
| අපානශාලා සහ උත්සවශාලා | කාමර 50 වැඩි හෝ ආසන 200 කට වැඩි, හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති |
| කර්මාන්තශාලා | සේවක සංඛ්‍යාව 100 ට වැඩි, වර්ග අඩි 3000 කට අධික පරිහරණ ප්‍රදේශයක්, ඝන අඩි 1 ක් හෝ මෙට්‍රික් ටොන් 1 ක් ජනනය වන කර්මාන්ත ශාලා ඇතුලු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති. |
| ආරෝග්‍යශාලා | ශල්‍යාගාර සහිත ආරෝග්‍යශාලා හෝ රෝගීන් 10ට වැඩි ප්‍රමාණයක් නැවතී ප්‍රතිකාර ගත හැකි ආරෝග්‍යශාලා. |

## උපලේඛණ 02

| වරද | ජනනය වන ස්ථානය | ස්ථානීය දඩ (රුපියල්) |
|---|---|---|
| අපද්‍රව අවිධිමත් ලෙස බැහැර කිරීම සහ තැන තැන අපද්‍රව්‍ය දමා යාම | නිවාස | 1,000/- |
| | **අන්තරාය නොවන අපද්‍රව්‍ය** | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 2,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්තශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 3,000/- |
| | **අන්තරායකාරී අපද්‍රව්‍ය** | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 3,500/- |
| | 02. * විශාල පරිමාණයේ ව්‍යාපාරික හා කර්මාන්තශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 5,000/- |
| | **සායනික අපද්‍රව්‍ය** | |
| | 01. කුඩා හා මධ්‍ය පරිමාණයේ ආරෝග්‍යශාලා ශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 3,500/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ආරෝග්‍යශාලා වලින් ජනනය වන අපද්‍රව්‍ය | 5,000/- |
| 02. අන්තරායකාරී නොවන නාගරික අපද්‍රව්‍ය අන්තරායකාරී හෝ සායනික අපද්‍රව්‍ය සමඟ මිශ්‍රකර පළාත් පාලන ආයතනයේ අපද්‍රව්‍ය එකතු කරන්නාට හෝ එම ආයතනය විසින් කාර්ය්‍ය සඳහා පත්කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවෙකුට භාර දීම. | 01. කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්තශාලා | 2,000/- |
| | 02. * විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත ශාලා | 5,000/- |
| | 03. කුඩා හෝ මධ්‍යම පරිමාණයේ ආරෝග්‍යශාලා | 2,000/- |
| | 04. * විශාල ප්‍රමාණයේ ආරෝග්‍යශාලා | 5,000/- |

## * සළකුණ

| ව්‍යාපාරය | විස්තරය |
|---|---|
| අපානශාලා සහ උත්සවශාලා | කාමර 50 වැඩි හෝ ආසන 200 කට වැඩි, හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති |
| කර්මාන්තශාලා | සේවක සංඛ්‍යාව 100 ට වැඩි, වර්ග අඩි 3000 කට අධික පරිහරණ ප්‍රදේශයක්, සහ අඩි 1 ක් හෝ මෙට්‍රික් ටොන් 1 ක් ජනනය වන කර්මාන්ත ශාලා ඇතුලු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති. |
| ආරෝග්‍යශාලා | ශල්‍යාගාර සහිත ආරෝග්‍යශාලා හෝ රෝගීන් 10ට වැඩි ප්‍රමාණයක් නැවතී ප්‍රතිකාර ගත හැකි ආරෝග්‍යශාලා. |